# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
# Central Bank Pensioner's Association

# වාර්ෂික වාර්තාව
# Annual Report
# 2020 / 2021

# ANNUAL REPORT – 2020 / 2021
## ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයින්ගේ සංගමය
## නිලධාරී මණ්ඩලය - 2021/2021

| | | |
|---|---|---|
| ගරු සභාපති | : | ජයලාල් ජයවර්ධන මහතා |
| ගරු උප සභාපති | : | ස්වර්ණා එස්.ජී. ගුණරත්න මහත්මිය |
| ගරු ලේකම් | : | ආරියදාස තන්ත්‍රීගේ මහතා |
| ගරු උප ලේකම් | : | කේ.එල්.පී.පී. රණතුංග මහත්මිය |
| ගරු උප ලේකම් | : | ලීලා මෝහන සුන්දරම් මහත්මිය |
| ගරු භාණ්ඩාගාරික | : | කේ.බී. දිසාකරුණා මහතා |
| ගරු උප භාණ්ඩාගාරික | : | ආර්.ඩී. ගුණසේන මහතා |
| ගරු උප භාණ්ඩාගාරික | : | එම්. මඩිගසේකර මහතා |
| ගරු විධායක කමිටුව | : | පී. අරුන්දව නාදන් මහතා |
| | | ජී.ඩබ්.යූ. ටිකිරි බණ්ඩා මහතා |
| | | යූ.එල්.එම්. නවුෆර් මහතා |
| | | හේමසිරි ෆර්ඩිනැන්ඩු මහතා (සංස්කාරක සැඳෑව) |
| | | ආර්.එම්. සෙනවිරත්න මහතා (සංස්කාරක සැඳෑව) |
| ගරු සමාජයීය ලේකම් | : | ජගත් කාරියවසම් මහතා |
| ගරු ගිණුම් පරීක්ෂක | : | කේ. ජෙගනාදන් මහතා |

**ප්‍රිය සාමාජික සාමාජිකාවනි,**

ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමික සංගමයේ 2020-2021 සඳහා වූ වාර්ෂික වාර්තාව මෙසේ ඔබ අතට පත් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි. ජීවිතයෙන් වැඩි කාලයක් මහබැංකු සේවයේ යෙදුනු අපට වසරකට වරක් එළඹෙන වාර්ෂික මහා සභා රැස්වීමේදී මහබැංකු විදු පියස තුලදී හෝ හමුවීමට ලැබීමම සතුටට කරුණකි. එහෙත් 2020 වර්ෂයේදී අප සැවොම මුහුණ දුන් කොරෝනා වසංගතය හේතුවෙන් එකී වසරේදී එම සොඳුරු හමුව අපට අහිමි විනි.

2020 වර්ෂයේ අප්‍රේල් අවසාන සතියේ වාර්ෂික මහා සභා රැස්වීමට අවශ්‍ය කටයුතු සියල්ලක්ම සූදානම් කරගෙන සිටිමුත් අවාසනාවකට මෙන් එදිනද අහිමි වී ගියේ කොරෝනා රකුසා මුළු රටම ගිලගනිමින් සිටි හෙයිනි. මේ වන විට අපේ මුළු සාමාජික සංඛ්‍යාව 1143 කි. වයෝවෘද්ධ භාවය හා විවිධ රෝගාබාධ හේතුවෙන් මියගිය සංඛ්‍යාව 32 කි. වාසනාවකට මෙන් කොරෝනා රෝගයෙන් කිසිදු විශ්‍රාමිකයෙකු මියගියේ ද නැත. නියමිත කාල වකවානුවේදී මහා සභාව රැස්වී නව විධායක මඩුල්ලක් පත්කර ගැනීමට නොහැකිවීම හා අදාළ වාර්තා ඉදිරිපත් කිරීමට නොහැකි වීමෙන් අප ගණුදෙනු සිදුකරන බැංකුවලින් නීතිමය ගැටළුවක් පැණ නැගිණි. මෙම ගැටළුව නිරාකරණය කරගැනීම් වස් සෞඛ්‍ය ක්‍රමවේදයන්ට යටත්ව අප නිවසේදී විධායක කමිටු රැස්වීමක් පැවැත්විනි. රටේ පවත්නා තත්ත්වය මත මහා සභා රැස්වීමක් පැවැත්විය නොහැකි අවස්ථාවක බලයේ සිටින කමිටුවම ඉදිරි කමිටුවේ යෝජනා ස්ථිරත්වයෙන් බලයේ සිටින කමිටුවම නැවත පත්කර ගැනීමට තීරණය කෙරිණි.

මෙහිදී විශේෂත්වයක් වූයේ හිටපු ලේකම් ජයලාල් ජයවර්ධන මහතා ගරු සභාපති ධූරයටත් සභාපති ධූරයේ සිටි ආරියදාස තන්ත්‍රිගේ මහතා ගරු ලේකම් ධූරයටත් පත්වීමයි. කමිටුව එයට එකඟතාවය දැක්වූ අතර සෙසු නිලතල එසේම පවත්වාගෙන යාමට විධායක කමිටුව තීරණය කරන ලදී.

නව අධිපති මහාචාර්ය ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් මහතා හමුවීමට අපට අවස්ථාව වෙන් කොට තිබුණේ 2020 මාර්තු 18 දිනදී ය. එවකට පැවති කොරෝනා වසංගතය නිසා එම අවස්ථාව අපට ගිලිහිණි. ඉන්පසු නැවතත් අවස්ථාවක් ලැබුණේ 2020 ජූලි 07 දිනයේදී ය. ජීවිතයේ සැඳෑ කාලයේ දිවිපෙවෙත ගතකරන විශ්‍රාමිකයන්ගේ ගැටළු සම්බන්ධයෙන් ඔවුනට සහනයක් ලබාදීම ආදී ප්‍රශ්න ගණනාවක් පිළිබඳ සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබුණි. අප ඉදිරිපත් කළ සියලු කරුණුවලට හොඳින් සවන් දුන් අධිපතිතුමා ඒවා විසඳ දෙන ලෙස දෙපාර්තමේන්තුව ප්‍රධානීන්ට උපදෙස් දෙනු ලැබීය. වර්ෂ ගණනාවක සිටම ඇදී ඇදී යන විශ්‍රාම වැටුප් ගැටලුව පිළිබඳව එතුමා මානව සම්පත් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ තුමියගෙන් විමසන ලද අතර ඇය අධිපතිතුමා ඉදිරියේ පවසා සිටියේ විශ්‍රාම වැටුප් පිළිබඳ ගැටලුව බොහෝ දුරට නිම කර ඇති බවත් ඒ සඳහා *database* එකක් ද සාදා ඇති බවත් ය. ඇය පැවසූ වදන් වලින් සෑහීමකට පත් වූ අප දෙවනුව ඉදිරිපත් කළේ මහබැංකු අවමංගල්‍යාධාර ක්‍රමයේ අක්‍රමිකතා පිළිබඳවයි. මියගිය විශ්‍රාමිකයන්ගේ

යැපෙන්නන්ට ලැබිය යුතු මුදල් නොලැබීම, විශ්‍රාමිකයන්ගේ ගැටලු නිරාකරණයට සුභ සාධන දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරියෙකු පත්කිරීම හා වෛද්‍ය සේවාවන්, රෝහල් ගාස්තු, බෙහෙත් මිලදී ගත් බිල්පත් වලට වැය වන මුදල් ප්‍රතිපූර්ණය කිරීමේ ප්‍රමාදය පිළිබඳවත් සාකච්ඡාවට බඳුන් විය. පවතින වසංගත තත්ත්වය මත සේවකයන් රාජකාරී සඳහා පැමිණීම අඩුවීම තුළින් මෙම ගෙවීම ප්‍රමාද වන බවත් ඉතා ඉක්මනින් මෙම සේවාවන් යථා තත්ත්වයට පත් කිරීමට කටයුතු කරන බවත් සුභ සාධක දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය අධ්‍යක්ෂ තුමිය පැවසීය. මේ සියල්ලම පරිපාලන ගැටළු බැවින් අදාල  නිලධාරීන් සමග සාකච්ඡා කර විසඳගැනීම සුදුසු බවත් අධිපතිතුමා අපට දන්වා සිටින ලදී. අප විධායක කමිටුවේ කිහිප දෙනෙකුට පමණක් අධිපති තුමා නැවත හමුවීමට අවස්ථාව ලැබුණේ 2020 ඔක්තෝම්බර් මස වුවත් පැවති කොවිඩ් ව්‍යසනය හේතුවෙන් කල්ගිය අතර අවසානයේ අවස්ථාවක් ලදුයේ 2021 ජනවාරි 31 දිනට යෙදුනු විරු සමරු දිනයේදී ය. එය නිල සාකච්ඡාවක් නොවුනත් මෙතෙක් නොකී නොවිසඳුණු ප්‍රශ්න අප එතුමාට ඉදිරිපත් කළෙමු. එම සාකච්ඡා විනාඩි 15 කට පමණක් සීමාවූ නිසාත් අප කළ කී දේ සටහන් කරගැනීමට නිලධාරියෙක් පවා එහි නොසිටියෙන් අපගේ ගැටලු නිරාකරණය කර ගැනීම පිළිබඳ සුහද සාකච්ඡාවක් පමණක්ම සිදු කෙරිණි.

## <u>වැටුප් කතිකාව</u>

මෙතෙක් අප සංගමයට හදපත්ලෙන්ම සහයෝගය දැක්වූ අධිපති තුමා ඇතුළු කාර්ය මණ්ඩලයට, ආරක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයට, විදු පියසේ අධ්‍යක්ෂක තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මුද්‍රණාල කළමනාකරු ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මහ බැංකුවේ ප්‍රවෘත්ති අංශයටත් කොරෝනා වසංගතය මැද පවතින නීති රීති වලට අනුගත වෙමින් විධායක කමිටු රැස්වීම් 08 ක් සඳහා සෞඛ්‍ය ආරක්ෂිතව මගේ නිවසට ද එක් රැස්වීමක් සඳහා කොටුව සෙන්ටර් පොයින්ට් වෙතද පැමිණි කමිටු සාමාජිකයන්ට ද, මුදල් කටයුතු නිසියාකාරව  පාලනය කළ හා හදිසි නීතිය පවා ක්‍රියාත්මක වුන ප්‍රදේශවලට ගොස් අවමංගල්‍ය ආධාර මුදල් කලට වෙලාවට අදාල අයවලුන්ට ලබාදුන් භාණ්ඩාගාරික ආර්.ඩී. ගුණසේන මහතාටත් අක්ෂි ශල්‍ය කර්මයකට ලක් වී සිටියදී පවා බිරිඳ සමග එක්ව සැඳෑව සෝදුපත් කියවා හරි වැරදි බලා සහය දුන් ජගත් කාරිවසම් මහතාට හා මුද්‍රණ හා පරිගණක කටයුතු කලට වේලාවට ඉටුකරදුන් කේ.බී. දිසාකරුණා මහතාටත් සැඳෑවට ලිපි සැපයූ සියලු දෙනාටත් මගේ හෘදයංගම ප්‍රණාමය පුද කරනු කැමැත්තෙමි.

## <u>ඉදිරි වර්ෂය සඳහා යෝජනා</u>

මෙවර මහා සභා රැස්වීමක් පැවැත්වීමට පෙර යෝජනා එවන ලෙස සාමාජිකත්වය දැනුවත් කිරීමට කාලය හරස් වූ නිසා පහත සඳහන් යෝජනා ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන්නෙමු.

1. 2006 දක්වා යාවත්කාලීන කළ වැටුප් ක්‍රමය 2015 දක්වා දීර්ඝ කිරීමටත් පාලක පක්ෂය පසුගිය වසරේ මේ පිළිබඳව ගනු ලැබූ තීරණය වෙනස් කොට නැවත ඒ ලබාදීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටීම.
2. සුභසාධක දෙපාර්තමේන්තුවේ අදූරදර්ශී පරිපාලනය හේතුවෙන් අවමංගල්‍ය සහනාධාර අරමුදලෙන් අපට අහිමි කල ලක්ෂ 80 කට ආසන්න මුදල නැවත එම අරමුදලට ලබාදීමට කටයුතු කිරීම. දැනට පොරොත්තු ලයිස්තුවේ සිටින තිහකට අධික විශ්‍රාමිකයන්ට හා ඔවුන්ගේ නම් කර ඇති යැපෙන්නන්ට මෙම මුදල් ගෙවීම වහාම සිදු කිරීමත් මෙම අක්‍රමිතා සිදු කළ නිලධාරීන් පිළිබඳව යොසා බලා වහාම පරීක්ෂණයක් පවත්වා ඔවුන් හට විනය ක්‍රියාමාර්ග ගැනීම හා වසර තුනක පමණ කාලයක සිට මෙයට විසඳුම් සොයන සුභසාධන අධ්‍යක්ෂවරියට මෙම කටයුතු නිමාකොට අපට විසඳුමක් ලබාදෙන ලෙස බල කිරීම.

3. ත්‍රෛවවාර්ෂිකව සිදු කරනු ලබන විශ්‍රාම වැටුප් වැඩි කිරීම මෙම වර්ෂය තුළ දී කළ යුතු වේ. ඒ පිළිබඳ සාකච්ඡා කිරීමේදී අප සංගමයේ විධායක කමිටුවටත් ඒ සඳහා සහභාගී කර ගන්නා ලෙසත් බැංකු සේවයක්ට වැටුප් වැඩි කිරීමේ දී වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමේ නිර්දේශවලට අනුකූලව 70% විශ්‍රාම වැටුප් වැඩිවීමක් අපට ලබාදෙන ලෙස පෙර කළ ඉල්ලීම තවදුරටත් ඉල්ලා සිටිමි.

**<u>විනෝද චාරිකා</u>**

2020/21 වර්ෂය තුළ රටේ පැවති කොරෝනා වසංගතය නිසා එක් දින සුහද හමුවීම් තෙදින චාරිකා පැවැත්වීමට නොහැකිවීම ගැන අපේ බලවත් කනගාටුව පළකරනු කැමැත්තෙමි.

**<u>1996 බෝම්බ ප්‍රහාරයෙන් මියගිය සහෘදයන් සිහිකිරීම.</u>**

මෙවර ද අප බැංකුව මගින් පවත්වනු ලැබූ පුෂ්ප පූජෝපහාරයට අප විධායක කමිටුව ද සහභාගී වන ලදී. හිතවතුන් කිහිප දෙනෙකු එක්වී මිය ගිය අයවලුන් වෙනුවෙන් තවත් පින් පැමිණවීමේ උත්සවයක් නුගේගොඩ විජේරාම පිරිවෙනහිදී පැවැත්විණි. එය සංවිධානය කළේ පෞද්ගලික මට්ටමෙන් බවත් එයට හේතුපාදක වූයේ ඔබට දැනුම් දීමට තරම් ප්‍රමාණවත් කාලයක් හා පහසුකමක් එම වකවානුවේ නොතිබීම බවත් කරුණාවෙන් සලකන්න.

**ඔබට සුභ අනාගතයක්**

ලේකම්

ආරියදාස තන්ත්‍රිගේ

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය
## 2020.12.31 දිනට අවසන් වූ වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම

| වියදම | සටහන | 2020 | 2019 | ආදායම | සටහන | 2020 | 2019 |
|---|---|---|---|---|---|---|---|
| **සංගමයේ සහනාධාර** | | | | විශ්‍රාමික සාමාජිකයන්ගෙන් ලැබීම් | | 1,560,200 | 1,474,000 |
| මහ සභාව | - | - | 252,135 | 1 දින චාරිකාවේ ලැබීම් | | | 10,405 |
| මරණාධාර | | 775,000 | 500,000 | 3 දින චාරිකාවේ අතිරික්තය | (1) | 29,635 | - |
| කටුවාපිටිය පල්ලියට දීමනාව | | 50,000 | - | අත්පොතේ මුද්‍රන ඉතිරිය | | - | 2,250 |
| 3 දින චාරිකාව | - | - | 18,555 | සම්පත් බැංකුවෙන් ලැබීම් | | - | 25,000 |
| **අනෙකුත් වියදම්** | | | | | | | |
| තැපැල් ගාස්තු | | 87,301 | 95,595 | **පොලී ආදායම** | | | |
| ප්‍රවාහනය | | 23,590 | 32,205 | හැ.නැ. බැංකුව ස්ථාවර තැන්පතු පොලී | | 413,971 | 328,447 |
| 3 දින චාරිකාවේ තොරතුරු බැලීම | | | 31,430 | හැ.නැ. බැංකුව භාණ්ඩාගාර බිල්පත් පොලිය | | 111,908 | 127,741 |
| වාර්ෂික වාර්තාව | | 23,100 | - | සම්පත් බැංකු භාණ්ඩාගාර බිල්පත් පොලිය | | 8,562 | 11,957 |
| ටයිප්, මුද්‍රණ හා පොටෝකොපි | | 19,956 | 28,331 | සම්පත් බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමේ පොලිය | | 8,844 | 8,427 |
| සංග්‍රහ දීමනා | | 11,870 | 13,382 | හැ.නැ. බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුම පොලිය | | 1,657 | 1,807 |
| SMS පණිවුඩ | | 6,000 | - | | | | |
| සැදෑව | | 4,920 | 17,377 | | | | |
| ප්‍රාදේශීය සංවිධාන | | 3,080 | 8,990 | | | | |
| වෙබ් අඩවිය | | 6,000 | 6,000 | | | | |
| විවිධ වියදම් | | 4,650 | 30,340 | | | | |
| ලිපිද්‍රව්‍ය | | 4,710 | 5,357 | | | | |
| බැංකු ගාස්තු | | 3,780 | 1,500 | | | | |
| රෝගී සාමාජිකයින් හමුවීම | | - | 9,138 | | | | |
| මල්වඩම් වියදම් කපාහැරීම | | - | 3,000 | | | | |
| ක්ෂය වීම | | 73 | 81 | | | | |
| වියදමට වැඩි ආදායම | | 1,110,747 | 936,618 | | | | |
| | | | | | | | |
| **මුළු එකතුව** | | 2,134,777 | 1,990,034 | | | 2,134,777 | 1,990,034 |

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමය
## 2020.12.31 දිනට ශේෂ පත්‍රය

| වගකීම් | | | වත්කම් | | |
|---|---|---|---|---|---|
| | 2020 | 2019 | | 2020 | 2019 |
| | | | කාර්යාලීය උපකරණ | 659 | 732 |
| සමුච්චිත අරමුදල | 6,352,325 | 5,415,707 | **ආයෝජන** | | |
| වියදමට වඩා ආදායම 2020 | 1,110,747 | 936,618 | ස්ථාවර තැන්පතු හැ.නැ.බැ. | 5,641,598 | 4,821,007 |
| දායකත්ව මරණ අරමුදල | 811,650 | 603,600 | භාණ්ඩාගාර බිල්පත් හැ.නැ.බැ | 1,547,832 | 1,435,924 |
| අවශ්‍ය පුද්ගලයින් සඳහා වූ අරමුදල | 6,210 | 6,210 | භාණ්ඩාගාර බිල්පත් සම්පත් බැංකුව | 146,452 | 146,452 |
| | | | **ජංගම වත්කම්** | | |
| | | | මහ බැංකුවෙන්ලැබිය යුතු සාමාජික මුදල් 2020 (2) | 228,700 | |
| | | | ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය | 149,540 | 58,269 |
| | | | මල්වඩම් සඳහා මහ බැංකුවෙන් ලැබිය යුතු | 31,500 | 64,850 |
| | | | **බැංකු ශේෂයන්** | | |
| | | | හැ.නැ.බැ. ජංගම ගිණුම | 217,935 | 162,471 |
| | | | හැ.නැ.බැ. ඉතිරි කිරීමේ ගිණුම | 57,009 | 55,352 |
| | | | සම්පත් බැංකුව ඉතිරි කිරීමේ ගිණුම | 221,765 | 204,359 |
| | | | අතැති මුදල් | 37,942 | 12,719 |
| | 8,280,932 | 6,962,135 | | 8,280,932 | 6,962,135 |

සභාපති　　　　භාණ්ඩාගාරික　　　　ගිණුම් පරීක්ෂක

# CENTRAL BANK OF SRI LANKA PENSIONERS' ASSOCIATION
## INCOME & EXPENDITURE FOR THE YEAR ENDED 31.12.2020

| EXPENSES | NOTE | 2020 | 2019 | INCOME | NOTE | 2020 | 2019 |
|---|---|---|---|---|---|---|---|
| **DONATION** | | | | PENSION CONTRIBUTION | | 1,560,200 | 1,474,000 |
| A.G.M. | | | 252,135 | EXCESS INCOME IN 1 DAY TOUR | | | 10,405 |
| DEATH DONATION | | 775,000 | 500,000 | EXCESS INCOME IN 3 DAY TOUR | 1 | 29,635 | |
| KATUWAPITIYA CHURCH | | 50,000 | | HAND BOOK EXCESS | | | 2,250 |
| 3 DAY TOUR | | | 18,555 | SAMPATH BANK DONATION | | | 25,000 |
| **OTHER EXPENSES** | | | | | | | |
| POSTAGE | | 87,301 | 95,595 | **INTEREST INCOME** | | | |
| TRANSPORT | | 23,590 | 32,205 | HNB. FIXED DEPOSITS | | 413,971 | 328,447 |
| 3 DAY TRIP (PILOT) | | | 31,430 | HNB TREASURY BILLS | | 111,908 | 127,741 |
| ANNUAL REPORT | | 23,100 | | SAMPATH TREASURY BILLS | | 8,562 | 11,957 |
| TYPE PRINT, POTO Copy | | 19,956 | 28,331 | SAMPAH SAVINGS ACCOUNT | | 8,844 | 8,427 |
| RREFRESHMENT | | 11,870 | 13,382 | HNB SAVINGS ACCOUNT | | 1,657 | 1,807 |
| SMS | | 6,000 | | | | | |
| SENDEWA | | 4,920 | 17,377 | | | | |
| REGIONAL ORGANITION | | 3,080 | 8,990 | | | | |
| WEBSITE | | 6,000 | 6,000 | | | | |
| MISCELLANEOUS | | 4,650 | 30,340 | | | | |
| STATIONARY | | 4,710 | 5,357 | | | | |
| BANK CHARGES | | 3,780 | 1,500 | | | | |
| VISIT SICK MEMBERS | | | 9,138 | | | | |
| WRITE OFF - WREATH EXPENSES | | | 3,000 | | | | |
| DEPRICIATION | | 73 | 81 | | | | |
| INCOME OVER EXPENSE | | 1,110,747 | 936,618 | | | | |
| | | | | | | | |
| | | 2,134,777 | 1,990,034 | | | 2,134,777 | 1,990,034 |

# CENTRAL BANK PENSIONERS' ASSOCIATION
## BALANCE SHEET AS AT 31.12.2020

| **LIABILITES** | | | **ASSETS** | | |
|---|---|---|---|---|---|
| | **2020** | **2019** | | **2020** | **2019** |
| ACCUMULATED FUND | **6,352,325** | **5,415,707** | OFFICE EQIPMENT | **659** | **732** |
| INCOME OVER EXPENCES | 1,110,747 | 936,618 | **INVESTMENT** | | |
| CONTRIBUTORY DUTY DONATION FUND | 811,650 | 603,600 | FIXED DEPOSIT - HNB | 5,641,598 | 4,821,007 |
| FUNDS FOR NEEDY PERSONS | 6,210 | 6,210 | T.B. HNB | 1,547,832 | 1,435,924 |
| | | | T.B.SAMPATH | 146,452 | 146,452 |
| | | | **CURRENT ASSETS** | | |
| | | | DUE FROM C.B. ON CONTRIBUTION (2) | 228,700 | |
| | | | DUE FROM C.B. ON WREATH | 31,500 | 64,850 |
| | | | INTEREST RECEIVABLE ON F.D. | 149,540 | 58,269 |
| | | | **BANK BALANCES** | | |
| | | | HNB CURRENT ACCOUNT | 217,935 | 162,471 |
| | | | HNB SAVING ACCOUNT | 57,009 | 55,352 |
| | | | SAMPATH SAVING ACCOUNT | 221,765 | 204,359 |
| | | | CASH IN HAND | 37,942 | 12,719 |
| | | | | | |
| | **8,280,932** | **6,962,135** | | **8,280,932** | **6,962,135** |

PRESIDENT TREASRER AUDITOR

NOTE - 1

THREE DAY TRIP PASIKUDA 6TH,7TH,8TH MARCH 2020

| | | |
|---|---|---|
| RECEIPTS FROM PARTICIPANTS | | 1,414,000 |
| **EXPENSES** | | |
| HOTEL CHARGES | 1,213,020 | |
| **OTHER EXPENSES** | | |
| BREAKFAST & LUNCH | 99,885 | |
| MISCELLANEOUS EXPENSES | 51,460 | |
| RT ABSENTES | 20,000 | |
| TOTAL EXPENSES | | 1,384,365 |
| EXCESS | | 29,635 |
| | | 1,414,000 |

Transport facility provided by Central Bank of Sri Lanka.

Note 2 - Due from Central Bank on Contribution in the year 2020.

සටහන - 1

**වාර්ෂික තුන්දින චාරිකාව 2020 මාර්තු 6, 7, 8 පාසිකුඩා**

| | | |
|---|---|---|
| සහභාගි වූ අයගෙන් ලැබීම් | | 1,414,000 |
| **වියදම්** | | |
| හොටෙල් ගාස්තු | 1,213,020 | |
| **අනෙකුත් වියදම්** | | |
| උදේ ආහාර සහ දිවා ආහාර | 99,885 | |
| විවිධ වියදම් | 51,460 | |
| නොපැමිණි අයට ගෙවීම් | 20,000 | |
| **මුළු වියදම** | | 1,384,365 |
| **අතිරික්තය** | | 29,635 |

**ප්‍රවාහන ගාස්තු මහබැංකුව සපයන ලදි.**

**සටහන 2 2020 වර්ෂය තුල මහ බැංකුවෙන් ලැබිය යුතු සාමාජික මුදල්**

## DEATH DONATION (DD) &
## CONTRIBUTORY DEATH DONATION - (CDD) 2020

| Pension No. | Name | D.D. | C.D.D. |
|---|---|---|---|
| 801 | MR. K. MAHALINGAM | 25,000/- | - |
| 505 | MR. S.W.P. AMARASURIYA | 25,000/- | - |
| 3022 | MR. N.W. DAYARATNE | 25,000/- | 75,000/- |
| 3241 | MR. G. WIMALSENA | 25,000/- | 75,000/- |
| 3272 | MR. W.G. CHANDRASIRI | 25,000/- | 75,000/- |
| 3593 | MR. W.H.A. COSTA | 25,000/- | 75,000/- |
| 235 | MR. G.A. JAYAWARDENA | 25,000/- | 75,000/- |
| 378 | MR. E.J. ANANDAPPA | 25,000/- | |
| 3586 | MR. B.N.U. JAYASUNDARA | 25,000/- | 75,000/- |
| 974 | MR. U.K.D. KARUNARATNE | 25,000/- | |
| 811 | MR. K.D. KASTURIRATNE | 25,000/- | 75,000/- |
| 531 | MR. D.L. JAYAMANNA | 25,000/- | 75,000/- |
| 917 | MRS. A. SUGATAPALA | 25,000/- | |
| 1279 | MR. SARATH DHARMASENA | 25,000/- | 75,000/- |
| 3573 | MR. G.K. FERNANDO | 25,000/- | 75,000/- |
| 742 | MR. K.S. GUNAWARDENA | 25,000/- | |
| 490 | MR. B.A.L.K. PERERA | 25,000/- | 75,000/- |
| 3426 | MR.E.W. PIYARATNE | 25,000/- | 75,000/- |
| 1185 | MR. A.M. WIJERATNE | 25,000/- | 75,000/- |
| 3794 | MR. D.M.W. DASSANAYAKE | 25,000/- | 75,000/- |
| 1073 | MR. P. KARUNARATNE | 25,000/- | 75,000/- |
| 640 | MRS. W.P.G. DHARMADASA | 25,000/- | 75,000/- |
| 450 | MRS. E.C. SRIWARDENA | 25,000/- | - |
| 655 | MRS. R.S.B.G. JAYASURIYA | 25,000/- | |
| 1025 | MR. CAPT. A.A.D. SENARATH | 25,000/- | 75,000/- |
| 449 | MR. N.E. RANSINGHE | 25,000/- | |
| 485 | MR. R. KUMARASIRI | 25,000/- | |
| 1014 | MR. A. SENARATNE | 25,000/- | 75,000/- |
| 3140 | MRS. A. MALIMAGE | 25,000/- | |
| 487 | MR. D.A.S.E. EDIRISINGHE | 25,000/- | 75,000/- |
| 3730 | MR. S.N.R. SERASINGHE | 25,000/- | 75,000/- |

| | | | |
|---|---|---|---|
| | | 775,000/- | 1,500,000/- |

# Diseased Members in 2020

| | | |
|---|---|---|
| 1 | 3593 | MR. W.H.A. COSTA |
| 2 | 235 | MR. G.A. JAYAWARDENA |
| 3 | 3705 | MR. W.S.B. ALWIS |
| 4 | 378 | MR. E.J. ANDANDAPPA |
| 5 | 3586 | MR. B.N.W. JAYASUNDARA |
| 6 | 974 | MR. U.K.D. KARUNARATHNA |
| 7 | 811 | MR. K.D. KASTURIRATNE |
| 8 | 531 | MR. D.L. JAYAMANNA |
| 9 | 917 | MRS. A. SUGATAPALA |
| 10 | 1273 | MR. K.A. SARATH DHARMASENA |
| 11 | 3573 | MR. G.K. FERNANDO |
| 12 | 742 | MR. K.S. GUNAWADENA |
| 13 | 490 | MR. B.A.L.K. PERRERA |
| 14 | 3426 | MR. E.W. PIYARATNE |
| 15 | 1185 | MR. A.M. WIJERATNE |
| 16 | 476 | MR. W.M.W. WANIGASINGHE |
| 17 | 15- W & OP | MRS. A. GUNAWARDENA |
| 18 | 3794 | MR. D.M.W. DASSANAYAKE |
| 19 | 1073 | MR. P. KARUNARATNE |
| 20 | 690 | MRS. P.G.DHARMADASA |
| 21 | 450 | MRS. E.C. SRIWARDENA |
| 22 | 655 | MRS. S.R.P.G. JAYASURIYA |
| 23 | 1025 | CAPT. A.A.D. SENARATH |
| 24 | 449 | MR.N.E. RANASINGHE |
| 25 | 485 | MR. R. KUMARASIRI |
| 26 | 1014 | MR. A. SENARATNE |
| 27 | 3140 | MRS. A. MALIMAGE |
| 28 | 982 | MRS. P. NELSON |
| 29 | WNOP 533 | MR. K.A.S. PERERA |
| 30 | 487 | MR. D.A.S.E. EDIRISINGHE |
| 31 | 3730 | MR. S.N.R. SERASINGHE |
| 32 | 3373 | MR. S.D. HARISON |

## ANNUAL REPORT 2020/2021
## CENTRAL BANK PENSIONER'S ASSOCIATION

## OFFICE BEARES – 2021

| | | |
|---|---|---|
| Honey. President | : | Mr. Jayalal Jayawardena |
| Hony Vice President | : | Mrs. Swarna S.A. Gunarathne |
| Hony. Secretary | : | Mr. Ariyadasa Thantrige |
| Hony. Asst. Secretary | : | Mrs. K.L.G.G. Ranatunga |
| Hony. Asst. Secretary | : | Mrs. Leela Mohana Sundaram |
| Hony. Treasurer | : | Mr. K.B. Dissakaruna |
| Hony. Asst. Treasurer | : | Mr. R.D. Gunasena |
| Hony. Asst. Treasurer | : | Mr. M. Madigasekara |
| Hony. Committee Members | : | Mr. P. Arunthavanathan |
| | | Mr. A.W.U. Tikiribanda |
| | | Mr. U.L.M. Naufur |
| | | Mr. Hemasiri Ferdinando (Chief Editor-Sandawa) |
| | | Mr. R.M. Seneviratne (Editor-Sandawa) |
| Hony. Social Secretary | : | Mr. Jagath Kariyawasam |
| Hony. Author | : | Mr. K. Jaganathan |

# ***Annual report- 2020/2021***

I take this as a great opportunity you have given me to present the annual report of the CBPA for the year 2020. We regret very much for not been able to have AGM in the year 2020 due to corona 19 prevailed in the country. As we were unable to appoint a new executive committee; same committee decided to carry out business of the association at EXCO meeting held on 2020.10.12. At this meeting Mr. Jayalal Jayawardena was appointed to the post of president and Mr. Ariyadasa Thanthrige was appointed to the post of Secretary of the association.

The subject of updating pension to 2015 was long outstanding and some of other demands were taken up at the meeting held with the new governor on 2020.07.07. The director H.R. said that the necessary data had been now collected. Then the Governor instructed to give a reply early. The D/HR replied by her letter dated 2020.08.13, that the Management committee of CBSL had decided, it was not agreeable to grant our request of updating pension to2015. We informed that we did not accept such a reply from the bank after taking a long time, nearly more than two years to give an answer.

Further we informed The Governor following matters.

Problems of the Death Donation fund conducted by the CBSL: Delay in payment to nominees of the deceased members. And also delay in reimbursement of medical bills. Still those problems are same. We handed over letters to Prime Minister, and President's Secretary Dr. P.B.Jayasundara and secretary to treasury Mr. S.R.Artigala (Both are former CBSL Officers) with regard to updating pension to 2015. We regret to inform the membership that our efforts were in wane. This year 2021 salaries of the employees are expected an increase. We have requested the bank again to update the pension to the year 2015 with effect from Jan 2021. Because of covid 19 pandemic we are not in a position to contact the Governor.

Last year the executive committee met 08 occasions at Nugegoda and only one meeting was held at Center point building of CBSL, due to the pandemic. We met the governor only once.

**Sendewa**

As the bank has decided to sell the press, we had to get services from private sector to print Sendewa spending own funds. Therefore, committee decided to publish annual reports for the year 2020 in this Sendewa.

It is our duty to thank Desabandu professor W.D.Luxman, Governor Central Bank of Sri Lanka for having a cordial relationship with us. Further, our thanks should go to DGs, AGs, HDDs and special thank should go to the Director and staff of the communication department and the staff at the press at Rajagiriya for printing Sendewa magazine. Also we extend our thanks to Director and staff of the security department for services rendered to the association.

My special thank should go to the Executive Committee for their assistance given to me. I also thank Mr. K.Jeganathan honorable auditor of the association. My special thank should go to the general membership for their corporation given to the executive committee.

**Wish you good health and long life.**
Ariyadasa Thanthrige.
Secretary.

## Auditor's reports on the Financial Statement Statement.

I have audited the accompanying financial statement of the Central Bank Pensioners' Association which comprises the balance sheet as at 31st December 2020 and the income and expenditure and the explanatory notes to the Accounts. I have obtained all the information and explanation which to the best of my knowledge and belief where necessary for the purpose of my audit. The financial Statement is a fair presentation and is free from the material miss statement whether due to fraud and error.

In my opining so far as appears from my examination, the Association maintained proper accounting records for the year ended 31st December 2020 and the financial statement give a true and fair view of the Association's state of the affairs as at 31st December 2020 and it's income for the year.

Signed by,
Mr. K. Jeganathan
Hony Auditor
02.04.2021

## ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ සාමාජිකත්වය වෙත ඉදිරිපත් කරනු ලබන

## ගරු ස්වාධීන විගණකගේ වාර්තාව

මා වෙත ඉදිරිපත් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ 2020 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ ශේෂ පත්‍රයන් ආදායම්, වියදම් ගිණුමත් පැහැදිලි කිරීමේ සටහනුත් විගණනයට භාජනය කරන ලදී.

මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට අවශ්‍ය කරන සියලුම පැහැදිලි කිරීම් හා තොරතුරු මා විසින් ලබා ගන්නා ලදී. ඉදිරිපත් කරන ඇති මූල්‍ය ප්‍රකාශනයන් පිළිගත හැකි තත්ත්වයෙන් ඉදිරිපත් කර තිබූ අතර ඒවා බලපෑම් කළ හැකි තරමේ මඟහැරීම්වලින් හා වංචා හෝ වැරදිවලින් නිදහස්ය.

මා විසින් කරන ලද විමර්ශනයේ හැටියට සංගමය විසින් විධිමත්ව හා නිවැරදිව තොරතුරු පවත්වාගෙන ගොස් ඇති අතර 2020 දෙසැම්බර් මස 31 දිනට ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන මගින් සත්‍ය හා නිවැරදි තොරතුරු ප්‍රකාශනයන් පිළිබිඹු කරන අතර එම දිනෙන් අවසන් වන වසර සඳහා නිවැරදි ආදායම් තත්වයක් දක්වා ඇත.

අත්සන් කළේ ඃ කේ.ජෙගනාදන්
2021-04-02
ගරු විගණක

# ශ්‍රී ලංකා මහ බැංකු විශ්‍රාමික්යින්ගේ සංගමය
# Central Bank Pensioner’s Association

**Sectretay,**
**104/8, Cooray Place,**
**Stanley Thilakarathna Mawatha,**
**Nugegoda.**